# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2185/67 - 2020 ජූලි මස 23 වැනි බ්‍රහස්පතින්දා - 2020.07.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

විධාන අංක 72

**2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත**

10 (1) (ආ) (ii) වැනි වගන්තිය යටතේ විධානය

2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 10 (1) (ආ) (ii) වැනි වගන්තිය යටතේ ක්‍රියා කරමින්, දේශීයව නිපදවන සහල් හෝ වී, සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා කෙළින්ම භාවිතා කිරීම හෝ අන්‍යාකාරයකින් සත්ත්ව ආහාර නිපදවීම සඳහා යෙදවුමක් ලෙස භාවිතා කිරීම සඳහා හෝ විකිණීම, විකිණීම සඳහා ඉදිරිපත් කිරීම, තොග රැස්කර තැබීම, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, බෙදා හැරීම හෝ මිලදී ගැනීම නොකළ යුතු බවට සියලුම නිෂ්පාදකයින්, වෙළෙඳුන් සහ බෙදාහරින්නන් වෙත මෙයින් විධාන කරනු ලැබේ.

මෙම විධානය වර්ෂ 2020 ජූලි මස 23 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අණ පරිදි,

**මේජර් ජෙනරාල් ශාන්ත දිසානායක (විශ්‍රාමික),**
සභාපති.

2020 ජූලි මස 23 වැනි දින,
කොළඹ දී ය.

08 - 126

1A - PG 5070 — 217 (2020/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*